# CATHOLIC BISHOPS' CONFERENCE IN SRI LANKA

**Lankarama, 19, Balcombe Place, Colombo - 08, Sri Lanka.**

Tel. No : 0094-11-2697062 / 2697110
Fax No : 0094-11-2699619
E-mail : EpiscopalSL@gmail.com


2023 ඔක්තෝබර් මස 06 වැනිදා

අතිගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ විධායක ජනාධිපති
ජනාධිපති ලේකම් කාර්යාලය
කොළඹ 01.

අතිගරු ජනාධිපතිතුමනි,

ඔබතුමන් මෑතක දී "ඩොයිෂ් වෙල්" රූපවාහිනී නාලිකාවේ මාර්ටින් ගැක් මහත්මා සමඟ කරන ලද සම්මුඛ සාකච්ඡාව වෙත අපගේ අවධානය යොමු වී ඇත. කතෝලික සභාව සමඟ ඔබතුමන්ගේ ගනුදෙනු සිදුවන්නේ කතෝලික රදගුරු සමුළුව සමඟ මිස කාදිනල් හිමිපාණන් සමඟ නොවන බව එම සාකච්ඡාවේ දී ඔබ තුමන් දිගින් දිගටම අවධාරණය කළේය.

කාදිනල් හිමිපාණන්, කොළඹ අගරදගුරු හිමිපාණන් ලෙස හුදකලා වූ අයකු නොව, ශ්‍රී ලංකා කතෝලික රදගුරු සමුළුව හා සමග පූර්ණ ලෙස බැඳුණු සහ වඩාත්ම වැදගත් සාමාජිකයකු බව මෙහි ලා සඳහන් කළ යුතුය. එහෙයින්, ඔබතුමන් කාදිනල් හිමිපාණන් පිළිබඳව ඒකීයව කරනු ලබන ඕනෑම සඳහනක් කතෝලික රදගුරු සමුළුවේ සාමූහිකත්වයට සිදු කරන හානියකි.

කතෝලික රදගුරු සමුළුව සමන්විත වන්නේ රදගුරු පදවි දොළහේ රදගුරු හිමිවරුන්ගෙන් සහ කොළඹ සහායක රදගුරු හිමිවරුන් තිදෙනාගෙනි.

පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරය පිළිබඳ ජනාධිපති විමර්ශන කොමිෂන් සභා වාර්තාවේ සියලු වෙළුම් කතෝලික රදගුරු සමුළුව වෙත ලබාදීම පිළිබඳව අපි ඔබතුමන්ට ස්තුති වන්ත වෙමු.

ෆෙඩරල් විමර්ශන කාර්යාංශය (FBI), බ්‍රිතාන්‍ය පොලිසිය, ඕස්ට්‍රේලියානු, ඉන්දියානු, චීන සහ පකිස්ථාන රහස් පරීක්ෂක කණ්ඩායම් එම ප්‍රහාරය පිළිබඳ වාර්තා ලබා දී ඇති බව ඔබතුමා එම සම්මුඛ සාකච්ඡාවේ දී වැඩිදුරටත් සඳහන් කරයි.

මෙම කරුණ, කතෝලික රදගුරු සමුළුවේ මෙන් ම පොදු ජනතාවගේ ද අවධානයට යොමු කර ඇත්තේ ප්‍රථම වතාවට ය.

මෙම තත්ත්වය තුළ ඉහත සඳහන් වාර්තාවන්හි පිටපත් ද ඔබතුමා අප හා සමග බෙදාගන්නේ නම් අපි එය අගය කොට සලකමු.

+ අති උතුම් හැරල්ඩ් ඇන්තනී පෙරේරා හිමි,
සභාපති,
ශ්‍රී ලංකා කතෝලික රදගුරු සමුළුව.
කුරුණෑගල රදගුරු හිමි.

+ අති උතුම් නොයෙල් ක්‍රිස්ටියන් එම්මානුවෙල් හිමි,
උප සභාපති,
ශ්‍රී ලංකා කතෝලික රදගුරු සමුළුව.
ත්‍රිකුණාමලය රදගුරු හිමි.

## CATHOLIC BISHOPS' CONFERENCE IN SRI LANKA

Lankarama, 19, Balcombe Place, Colombo - 08, Sri Lanka.

Tel. No : 0094-11-2697062 / 2697110
Fax No : 0094-11-2699619
E-mail : EpiscopalSL@gmail.com


+ අති උතුම් ජේ. ඩී. ඇන්තනී ජයකොඩි හිමි,
මහ ලේකම්,
ශ්‍රී ලංකා කතෝලික රදගුරු සමුළුව.
කොළඹ සහයක රදගුරු හිමි.

+ අති උතම් මැල්කම් කාදිනල් රංජිත් හිමි,
කොළඹ අගරදගුරු හිමි.

+ අති උතම් දෙව්ශ්‍රිත වැලන්ස් මෙන්ඩිස් හිමි,
මහනුවර රදගුරු හිමි.
හලාවත අපෝස්තලික පරිපාලක රදගුරු හිමි.

+ අති උතම් නෝබට් එම්. අන්ද්‍රාදි නි.ම.නි. හිමි,
අනුරාධපුර රදගුරු හිමි.

+ අති උතම් ක්ලීටස් සී. පෙරේරා, සා.බෙ.නි. හිමි
රත්නපුර රදගුරු හිමි.

+ අති උතුම් එමානුවෙල් ප්‍රනාන්දු හිමි
මන්නාරම් රදගුරු හිමි.

+ අති උතුම් රේමන්ඩ් කේ. වික්‍රමසිංහ හිමි,
ගාල්ල රදගුරු හිමි.

+ අති උතුම් ජස්ටින් බර්නාඩ් ඥානප්‍රගාසම් හිමි
යාපනය රදගුරු හිමි.

+ අති උතුම් ජෝසප් පොන්නයියා හිමි,
මඩකලපුව රදගුරු හිමි.

+ අති උතම් ජුඩ් නිශාන්ත සිල්වා හිමි
බදුල්ල රදගුරු හිමි.

+ අති උතුම් පි. ඇන්ටන් රංජිත් හිමි
කොළඹ සහයක රදගුරු හිමි.

+ අති උතුම් මැක්ස්වල් ජී. සිල්වා,
කොළඹ සහයක රදගුරු හිමි.

CATHOLIC BISHOPS' CONFERENCE * SRI LANKA *